# මීගමුව අධ්‍යාපන කලාපය
# දෙවන වාර ඇගයීම - 2025
# ඉතිහාසය

විභාග අංකය:.........................................

| 11 ශ්‍රේණිය | I කොටස | කාලය පැය 1 |
|---|---|---|

සැලකිය යුතුය

- සියලුම ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.
- අංක 1 සිට 40 තෙක් ප්‍රශ්න වල දී ඇති (1),(2) (3) (4) පිළිතුරු වලින් වඩාත් නිවැරදි පිළිතුර තෝරන්න. එම අංකය මත X ලකුණ යොදන්න.

(01) පහත මූලාශ්‍ර අතරින් බුදුරජාණන් වහන්සේගේ ලංකාගමනයේ සිට මහසෙන් රාජ්‍ය සමය දක්වා මෙරට ඉතිහාසය හැදෑරීමේදී වැදගත් වන්නේ,

1. පූජාවලිය
2. නිකාය සංග්‍රහය
3. දීපවංසය
4. රාජාවලිය

(02) ඓතිහාසික කාල අනුපිළිවෙල සකස් කර ගැනීමේදී වඩාත් වැදගත් වන්නේ,

1.සාහිත්‍ය මූලාශ්‍රය ය.
2. අභිලේඛන ය.
3. නානක මූලාශ්‍රය ය.
4. පුරාවස්තු ය.

(03) ක්‍රි.ව පස්වන සියවසයේදී ලංකාවට පැමිණ අභයගිරි විහාරයේ දෙවසරක් ජීවත් වෙමින් ලංකාව පිළිබඳව තොරතුරු වාර්තා කරන ලද විදේශිකයා කවුද?

1. රිබෙයිරෝ
2. හියුං සාං
3. ඉබන් බතූතා
4. පාහියන් හිමි

(04) ප්‍රාග් ඓතිහාසික මානවයා වාසය කළ පහතරට තෙත් කලාපීය එළිමහන් වාසස්ථානයක් වන්නේ මින් කුමක්ද?

1. කුරුවිට බටදොඹලෙන
2. බෙල්ලන්බැඳිපැලැස්ස
3. පතිරාජවෙල
4. මිනිහාගල්කන්ද

(05) ප්‍රාග් ඓතිහාසික යුගයට අයත් ගල් මෙවලම් හමුවී ඇති පතිරාජවෙල ප්‍රදේශයේ ඉරණමඩු සැකැස්මට අයත් බොරළු තට්ටුව කාල නිර්ණය අනුව අයත් වන කාලසීමාව කුමක්ද?

1. වසර එක්ලක්ෂ විසිපන් දහසක් පැරණි ය.
2. වසර අසූ දහසක් පැරණි ය.
3. වසර තිස් අට දහසක් පැරණි ය.
4. වසර විසි අටදහසක් පැරණි ය.

(06) දඩයමින් ජීවත්වූ ආදි මානවයා ගොවිතැන කෙරෙහි යොමු වීමට බලපෑ මූලික පරිසරාත්මක හේතුව මින් කුමක්ද?

1. පසෙහි සාරවත් බව වැඩිවීම
2. වගාවට සුදුසු දේශගුණයක් තිබීම
3.පැවති ශීත දේශගුණය වෙනස්වී උණුසුම් දේශගුණයක් ඇරඹීම
4. ජන සංඛ්‍යාවේ වැඩිවීම හා ව්‍යාප්තිය

(07) වැව් ප්‍රපතනය හෙවත් ‘එල්ලංගාව’ ලෙස හඳුන්වන ලද්දේ මින් කුමක්ද?

1. කුඩා කුඩා වැව් නිර්මාණය කිරීමයි.
2. වැව් අවට බිම් වල තෙතමනය ආරක්ෂාවීමට යොදා ගත් ක්‍රමවේදයයි.
3. කුඩා වැව් කීපයක් ඇළමාර්ග මගින් සම්බන්ධ කිරීමයි.
4. ගම්මාන කීපයක් සඳහා විශාල වැවක් නිර්මාණය කිරීමයි.

(08) ශ්‍රී ලංකාවේ අතීතයේ රාජත්වය හිමිවූ ආකාරය අනුව පහත I හා II තීරුව නිවැරදිව ගැළපූ විට ලැබෙන නිවැරදි පිළිතුර කුමක්ද?

| I | II |
|---|---|
| A පියාගෙන් පුතාට | E සද්ධාතිස්ස රජු |
| B සහෝදරයාගෙන් සහෝදරයාට | F ශ්‍රී වික්‍රම රාජසිංහ රජු |
| C රජුගේ බිරිඳගේ සහෝදරයාට | G තුන්වන වික්‍රමාහු රජු |
| D රජුගේ සොහොයුරියගේ පුත්‍රයාට | H වංකනාසික තිස්ස රජු |

1.HEFG　　2.EGHF
3.GHEF　　4. FGEH

(09) හතරවන කාශ්‍යප රජතුමා අනුරාධපුරයේ දරුණු උණ රෝගයක් පැතිරී ගිය අවස්ථාවේදී එයට ප්‍රතිකාර කිරීමට තැනූ රෝහල් විශේෂය හැඳින්වූ නම කුමක්ද?

1. සොත්ථි ශාලා　　2. සිවිකා ශාලා
3. උපසග්ගරෝගනාස　　4. පසවන්තිනාමසාලා

(10) පහත සිදුවීම් අතරින් ලංකාව එක්සේසත් කොට පොළොන්නරුවේ රජ බවට පත්වූ පළමුවන විජයබාහු රජතුමාට අසන්නට, දකින්නට නොලැබෙන සිදුවීම මින් කුමක්ද?

1. ශ්‍රී මහා බෝධි රෝපණ උත්සවය
2.චෝළ ආක්‍රමණය
3. iv වන උදය රජු විසින් සොරබොර වැව ලිපිය කරවීම
4. පොළොන්නරු ගල් විහාරය කරවීම

(11) හේන් වගාව වෙනුවෙන් අය කළ බදු වර්ගයක් වනුයේ මින් කුමක්ද?

1. කැති අඩ　　2. බොජකපති
3. දකපති　　4. මතෙර මජිබක

(12) මාතොට වරායට සමීපව ඉදිකර ඇති පැරණි හින්දු කෝවිල කුමක්ද?

1.නල්ලූර්　　2.තිරුකේතීෂ්වරම්
3.කෝණේශ්වරම්　　4. මුන්නේශ්වරම්

(13) පැරණි සමාජයේ ප්‍රභුත්වයක් හිමිකර ගැනීම සඳහා හේතුවූ වැදගත්ම සාධකය වූයේ මින් කුමක්ද?

1.ඉඩම් පිළිබඳ පරම්පරාගත අයිතිය　　2.වෙළඳාමෙන් ඉපැයූ ධනය
3.නිෂ්පාදන අතිරික්තය සඳහාවූ හිමිකම　　4. නගරයක ජීවත්වීම

(14) ජල කළමණාකරණය, කලාත්මක බව හා තාක්ෂණය සංකලනයවූ විශිෂ්ඨ නිර්මාණයක් ලෙස අගය කළ හැක්කේ මින් කුමක්ද?

1. සොරොව්ව　　2. අනුරාධපුර ගල් පාලම
3.කුට්ටම් පොකුණ　　4. යෝධ ඇළ

(15) පහත ගොඩනැගිලි අතරින් අග්නිදිග ආසියාතික කලාවේ ආභාෂය ඇති ඉදිකිරීම කුමක්ද?

1. ලංකාතිලක පිළිමගෙය　　2. තිවංක පිළිමගෙය
3. සත්මහල් ප්‍රාසාදය　　4. පොතුගුල් විහාරය

(16) මහනුවර රාජධානි සමයේ ඇතුන් භාරව කටයුතු කළ නිළධාරියා හැඳින්වූ නාමය කුමක්ද?

1. ගජනායක නිළමේ　　2. දියවඩන නිළමේ
3. අස්පන්තියේ මුහන්දිරම්　　4. ඇත් පන්තියේ මුහන්දිරම්

(17) පහත දැක්වෙන ඓතිහාසික සිදුවීම් සිදුවූ කාල අනුපිළිවෙල නිවැරදිව දැක්වෙන පිළිතුර කුමක්ද?

A සිංහල සංගේ නම් කැරැල්ල ඇතිවීම

B ඇම්බැක්කේ දේවාලය කරවීම

C බෙලිගල දළදා මැදුරක් කරවීම

D කාලිංගරායර් හා චෝඩගංග සෙන්පතීන්ගේ ආක්‍රමණය

1. ABCD
2. CDBA
3. CDAB
4. DCBA

(18) ඉරාස්මස්, ජෝන් හස්, ජෝන් වෛක්ලිෆ්, මාටින් ලූතර් වැනි අය පුනරුද සමයේදී වඩාත් ප්‍රසිද්ධියට පත්වූයේ කුමන කරුනක් උදෙසාද?

1. විශ්වය පිළිබඳ නව මත ඉදිරිපත් කිරීම නිසා
2. චිත්‍ර හා මූර්ති කලාවේ උන්නතිය උදෙසා කැපවීම නිසා
3. සාහිත්‍යයේ දියුණුව සඳහා ග්‍රන්ථ රචනා කිරීම නිසා
4. පල්ලියේ ආධිපත්‍යය විවේචනය කිරීම නිසා

(19) පහත සඳහන් A හා B ප්‍රකාශ ඇසුරින් පිළිතුරු සපයන්න.

A - ආනයන අපනයන ආර්ථිකයක් තිබීම.

B - මුදල් භාවිතය ප්‍රචලිත වීම.

යුරෝපයේ ඇතිවූ පුනරුදය ශ්‍රී ලංකාව කෙරෙහි ඇතිකළ බලපෑම සම්බන්ධයෙන්,

1. A හා B සත්‍ය වේ.
2. A හා B අසත්‍ය වේ.
3. A සත්‍ය වන අතර B අසත්‍ය වේ.
4. A අසත්‍ය වන අතර B සත්‍ය වේ.

(20) ශ්‍රී ලංකාවට පැමිණි පෘතුගීසීන් ලංකාව හැඳින්වූ නාමය කුමක්ද?

1. සිලෝන්
2. තැප්‍රොබේන්
3. සෙරන්ඩිබ්
4. සෙයිලන්

(21) උඩරට රාජ්‍යය තුළ පෘතුගීසි බලය පැතිරවීමට ගත් ප්‍රයත්නයක් නොවන්නේ කුමක්ද?

1. දන්තුරේ සටන
2. මුල්ලේරියා සටන
3. බලන සටන
4. රන්දෙණිවෙල සටන

(22) කෘෂිකර්මාන්තයේදී පේළි වැපිරීමේ ක්‍රමය මගින් අත්වන වාසියක් වූයේ මේ අතරින් කුමක්ද?

1. වගා භූමි ක්‍රමානුකූලව පිළිවෙලට පවත්වා ගැනීම.
2. වගාවට පොහොර යෙදීම පහසු වීම
3. වැපිරීමට අවශ්‍ය බීජ ප්‍රමාණය අඩුකර ගතහැකිවීම.
4. රෝග ව්‍යාප්තිය අවම කරගත හැකිවීම.

(23) කාර්මික විප්ලවය තුළින් සමාජ ක්ෂේත්‍රයට ඇතිකළ බලපෑමක් වූයේ මින් කුමක්ද?

1. ස්වයංපෝෂිත ආර්ථික රටාව බිඳවැටීම
2. පන්ති සහිත සමාජයක් බිහිවීම
3. බද්ධ ව්‍යාපාර හා බැංකු ආරම්භ වීම
4. සේවක වැඩවර්ජන හා අයිතිවාසිකම් සඳහා සටන් කිරීම

(24) පහත සඳහන් ඓතිහාසික තොරතුරු අනුපිළිවෙළට පෙළගැස්වූ විට ලැබෙන නිවැරදි පිළිතුර තෝරන්න.

A - ෆෙඩ්රික් නෝර්ත් ගේ උඩරට ආක්‍රමණය

B - මුහුදුබඩ ප්‍රදේශ බ්‍රිතාන්‍ය කිරීටයේ යටත් විජිතයක් බවට පත්වීම

C - ඉංග්‍රීසීන්ඉන්දියාවේ මුගල් අධිරාජ්‍යයා වූ ජහන්ගීර් සමඟ වෙළඳ කටයුතු පිළිබඳ සාකච්ඡා පැවැත්වීම

D - ජෝන් ඩොයිලි නම් සිවිල් සේවකයා මෙරට සේවයට පැමිණීම

1. CBAD
2. CBDA
3. BACD
4. CABD

(25) 1815 ඓතිහාසික උඩරට ගිවිසුම අත්සන් කිරීමෙන් පසු,

1. වෙරළබඩ ප්‍රදේශ ඉංග්‍රීසීන්ට යටත් විය. 2. ද්විත්ව පාලන ක්‍රමය අවසන් විය.
3. උඩරට ඉංග්‍රීසීන්ට යටත් විය. 4. ශ්‍රී ලංකාව ඉංග්‍රීසි යටත් විජිතයක් විය.

(26) ක්‍රි.ව 1848 නිදහස් අරගලයෙන් පසු දේශීය ජනතාවට සහන සැළසීමට බ්‍රිතාන්‍ය ආණ්ඩුව ගත් ක්‍රියාමාර්ගයක් වන්නේ මින් කවරක්ද?

1. බදුවර්ග කීපයක් අහෝසි කිරීම
2. මහජනතාවගේ ගැටළු විසඳීමට කමිටුවක් පත් කිරීම
3. නැවත වී වගාව දියුණු කිරීමට කමිටුවක් පත් කිරීම
4. අත්අඩංගුවට ගත් දේශීය නායකයින් නිදහස් කිරීම

(27) බෞද්ධ ආගමික පුනරුදය සඳහා වලිසිංහ හරිස්චන්ද්‍ර මැතිතුමාගෙන් සිදුවූ සේවාවක් වන්නේ කුමක්ද?

1. බෞද්ධ කොඩිය නිර්මාණය කිරීම
2. නවකතා වල විවිධ චරිත සංවාදයට ලක්කොට මධ්‍යසාර භාවිතයේ අනිසි ප්‍රතිවිපාක පැහැදිලි කිරීම
3. අනුරාධපුරයේ ඇති පූජනීය ස්ථාන රැක ගැනීමට කටයුතු කිරීම
4. පුවත්පත් හා දේශනා මගින් ජාතික පුනරුදයට අනුග්‍රහ දැක්වීම

- පහත A සිට E දක්වා ඇති ප්‍රකාශ ඇසුරින් 28 හා 29 ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.

A - මුස්ලිම් නෙයිසන් පුවත්පත ඇරඹීම
B - පරම විඥානාර්ථ සමාගම පිහිටුවීම
C - කොළඹ සහිරා විදුහල ආරම්භ කිරීම
D - උදයභානු පුවත්පත ඇරඹීම
E - ශිවන්ගල විද්‍යාලය ආරම්භ කිරීම

(28) සිද්දි ලෙබ්බේ මහතා හා සම්බන්ධ කරුණු ඇතුළත් පිළිතුර කුමක්ද?

1. A හා B 2. A හා C
3. B හා C 4. C හා D

(29) ආර්මුග නාවලර් තුමා හා සම්බන්ධ කරුණු ඇතුළත් පිළිතුර කුමක්ද?

1. A හා E 2. D හා E
3. C හා E 4. D හා C

(30) 1829 ට පසුව මෙරට ආර්ථිකය පිළිබඳ සොයාබලා නිර්දේශ ඉදිරිපත් කිරීමට පැමිණි පුද්ගලයෙක් වන්නේ,

1. ද මියුරන් 2. විලියම් කෝල්බෲක්
3. ජෝර්ජ් වෝල් 4. කෲව් මැකලම්

(31) 1919 පිහිටවූ ලංකා ජාතික සංගමය පිළිබඳව සාවද්‍ය ප්‍රකාශය තොරන්න.

1. සංගමයේ ප්‍රථම සභාපති පොන්නම්බලම් අරුණාචලම් මහතාය.
2.සංගමයේ ප්‍රධාන අරමුණ දේශපාලන බලය ලාංකිකයින් අතට ගැනීමයි.
3. සංගමය තුළ දෙමළ හා මුස්ලිම් ජනකොටස් නියෝජනය නොවීය.
4. සංගමය පිහිටවූයේ නිදහස වෙනුවෙන් පැවති ලොකු කුඩා සංවිධාන සියල්ල එක්වය.

- පහත A සිට E දක්වා ඇති තොරතුරු ඇසුරින් 32 සිට 34 දක්වා ඇති ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.

A විධායක කාරක සභා ක්‍රමය
B බලය හා වගකීම වෙන්වීම
C ව්‍යවස්ථාදායකය රාජ්‍ය මන්ත්‍රණ සභාව වීම
D ප්‍රථම වරට ඡන්ද බලය ක්‍රියාත්මක වීම
E නිල ලත් පිරිසට වඩා නිළ නොලත් පිරිස වැඩිවීම

(32) 1910 කෲව් මැකලම් ආණ්ඩුක්‍රමයට ආවේනික ලක්ෂණ වන්නේ,

1. B　　2. C
3. D　　4. E

(33) මැනිං ආණ්ඩුක්‍රමයට ආවේනික ලක්ෂණ වන්නේ,

1. B　　2. C
3. D　　4. E

(34) A අක්ෂරයෙන් දක්වා ඇති දේශපාලන ලක්ෂණය සම්බන්ධවූ ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණය වන්නේ කුමක්ද?

1. 1833 කෝල්බෲක් කැමරන් ප්‍රතිසංස්කරණය
2. 1910 කෲව් මැකලම් ප්‍රතිසංස්කරණය
3. 1924 මැනිං ඩෙවොන්ෂයර් ප්‍රතිසංස්කරණය
4. 1931 ඩොනමෝර් ප්‍රතිසංස්කරණය

(35) බ්‍රිතාන්‍ය පාලනය නිසා ශ්‍රී ලංකාවේ ඇතිවූ ප්‍රධාන ආර්ථික වෙනස්කමක් වූයේ මින් කවරක්ද?

1.අපනයන වැවිලි බෝග හඳුන්වා දීම　　2. නාගරික හා වතු කම්කරුවන් බිහිවීම
3.රාජකාරී ක්‍රමය ක්‍රියාත්මක වීම　　4. ඉංග්‍රීසි අධ්‍යාපනය ඇරඹීම

- පහත A හා B ප්‍රකාශ ඇසුරින් 36 හා 37 ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.

(36)　A - ලුල්කඳුර වතුයාය
　B - ගම්පොළ සිංහපිටිය

තේ වගාවේ ආරම්භය සම්බන්ධයෙන්,

1. A සහ B සත්‍ය වේ　　2.A සත්‍ය වන අතර B අසත්‍ය වේ
3.A හා B අසත්‍ය වේ　　4. A අසත්‍ය වන අතර B සත්‍ය වේ

(37)　A ලංකා සමසමාජ පක්ෂය
　B ආචාර්ය ඈන්.ඇම් පෙරේරා මහතා

ලංකාවේ වාමාංශික දේශපාලන පක්ෂ සම්බන්ධයෙන්

1. A හා B සතය වේ　　2. A සත්‍ය වන අතර B අසත්‍ය වේ
3. A හා B අසත්‍ය වේ　　4. A අසත්‍ය වන අතර B සත්‍ය වේ

- පහත A,B,C හා D යටතේ දක්වා ඇති එක් එක් යුගලයෙහි පළමුවැන්න හා දෙවැන්න අතර සම්බන්ධතාව පරීක්ෂා කර බලා අංක 38 සිට 40 දක්වා ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.

A　i. ශ්‍රී ලංකාව පළාත් පහකට බෙදීම
　ii. ඩොනමෝර් ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණය

B.　i. බ්‍රිතාන්‍ය පාලනය
　ii මධ්‍යම පන්තිය බිහිවීම

C.　i සූරියමල් ව්‍යාපාරය
　ii පොපී මල් ව්‍යාපාරය.

D　i කෝපි වගාව
　ii ඉන්දියානු වතු කම්කරුවන්ගෙන්වා ගැනීම

(38) පළමුවැන්නේ ප්‍රතිඵලයක් ලෙස දෙවැන්න බිහිවූ බව දැක්වෙන පද යුගලය කුමක්ද?

1. A　　2. B
3. C　　4. D

(39) දෙවැන්නේ ප්‍රතිඵලයක් ලෙස පළමුවැන්න ඇතිවූ බව දැක්වෙන පදයුගලය කුමක්ද?

1. A　　2. B
3. C　　4. D

(40) පළමුවැන්නේ වර්ධනයට දෙවැන්න හේතුවූ බව දැක්වෙන පද යුගලය වන්නේ කුමක්ද?

1. A　　2. B
3. C　　4. D